# 2.15 ශ්‍රී ලංකාවේ කුල ක්‍රමය සහ ඉඩම් භුක්තිය
## (නෙළුව ,මැදගම, ග්‍රාමය ආශ්‍රයෙන්)

ඩී.එස්.ඩබ්. ගුණවර්ධන
සමාජ විද්‍යා අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRAT

ශ්‍රී ලංකාවේ ගැමි සමාජ ව්‍යුහය හා සංවිධානය පිලිබඳ අවධානය යොමු කිරීමේදී සාම්ප්‍රදායික සමාජ අවධියේ මෙන්ම වර්ථමාන සමාජ අවධියේදී ද සුවිශේෂී වැදගත්කමක් කුලය සහ ඉඩම් භුක්තියට හිමිව තිබේ. කුලය සහ ඉඩම් භුක්තිය ග්‍රාමීය ජන ජීවිතය සමග සම්බන්ධ වී තිබූ ආකාරය බොහෝ දෙනා (Ryan: 1953, Peris: 1956, Leach: 1961, Yalman: 1967, Obeysekere: 1967, Karuíthilake:2001) විසින් අධ්‍යයනය කර තිබෙන අතර මෙම අධ්‍යයනයන් පරීක්ෂා බැලීමේදී කුලය සහ ඉඩම් භුක්තිය අතර පවතින සම්බන්ධතාවය පුළුල් ලෙස හඳුනාගැනීමට උත්සාහ ගෙන නොමැති බව පැහැදිලි විය. මෙවැනි පසුබිමක කුලය සහ ඉඩම් භුක්තිය අතර පවතින සම්බන්ධතාවය හඳුනාගැනීමට මෙම අධ්‍යයනයේ මූලික අරමුණ විය.

මෙම අධ්‍යයනයේදී අධ්‍යයන ගැටළුව වශයෙන් ශ්‍රී ලංකාවේ කුල ක්‍රමය සහ ඉඩම් භුක්තිය අතර සම්බන්ධයක් තිබේද? යන ගැටළුව ගොඩනගාගත් අතර අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් මැදගම ග්‍රාමය තෝරා ගනු ලැබීය. සාම්ප්‍රදායික ගමක හඳුනාගත හැකි ලක්ෂණ අදටත් ශේෂව පවතින ගමක් වශයෙන් මැදගම හඳුනාගත හැකි වේ. එමෙන්ම කුල ක්‍රමය පිලිබඳ අවධානය යොමු කිරීමේ දී කුල කිහිපයක් නියෝජනය කරන ජනකොටසක් ගම තුළ දක්නට ලැබේ. මීට අමතරව ශ්‍රී ලංකාවේ ගැමි සමාජ ආශ්‍රයෙන් කරන ලද අධ්‍යයනයන් පිලිබඳ සැලකීමේ දී ගනනාථ ඔබේසේකර විසින් සිදු කරන ලද අධ්‍යයනයේදී (Land Tenture in Village Ceylon, Cambridge University Press, Cabridge, 1967) අධයයන ක්ෂේත්‍රය වශයෙන් මැදගම ග්‍රාමය තෝරාගෙන තිබීම නිසා සමාජ මානව විද්‍යාත්මකව මැදගම ග්‍රාමයට වැඩි වටිනාකමක් හිමිව තිබේ. මේ නිසා පර්යේෂණ ක්ෂේත්‍රය වශයෙන් මැදගම ග්‍රාමය තෝරාගෙන මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

මෙහිදී අධ්‍යයන ක්‍රමවේදය ලෙස ගමේ ඓතිහාසික පසුබිම සහ ගමේ ක්‍රමික විකාශනය සොයා බැලීමට සහ ඓතිහාසික ක්‍රමය (Historical Method) ද සාම්ප්‍රදායික අවධියේ කුලය සහ ඉඩම් භුක්තිය සංවිධානය වී තිබූ ආකාරය වර්ථමානයේ කෙබඳු ස්වරූපයක් ගෙන තිබේද යන්න හඳුනා ගැනීමට තුලනාත්මක ක්‍රමය (Comparative Method) ද ප්‍රයෝජනයට ගනු ලැබීය. දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම අතරින් සහභාගිත්ව නිරීක්ෂණ ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය (Participant observation Method and Interview Method) ප්‍රධාන වශයෙන් යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

මෙම අධ්‍යයනයේදී ඉටුකරගැනීමට අපේක්ෂිත මූලික පරමාර්ථ කිහිපයකි. එනම්, සාම්ප්‍රදායික සමාජ අවදියේ කුලය සහ ඉඩම් භුක්තිය අතර තිබූ සම්බන්ධතාවය වර්තමානයේ කෙබඳු ස්වරූපයක් ගෙන තිබේද යන්න සොයා බැලීමට සහ කුලය සහ ඉඩම් භුක්තිය අතර තිබූ සම්බන්ධතාවය වෙනස් වීමට බලපෑ ඇති හේතු සාධක සොයා බැලීම.

මේ ආකාරයට සිදුකරගෙන යනු ලබන මෙම අධ්‍යයනයේදී හඳනා ගැනීමට හැකි වූයේ ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ගැමි සමාජ ව්‍යුහය තුල කුලය සහ ඉඩම් භුක්තිය අතර දැඩි සම්බන්ධතාවයක් පැවති බවත්, නමුත් මෙම සම්බන්ධතාවය මේ රටේ නිදහසින් පසු සමාජ, ආර්ථික, සංස්කෘතික සහ පරිපාලනමය අංශයන්ගේ සිදු වූ ප්‍රතිසංසකරණයන් විශේෂයෙන් නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තීන් සහ විවෘත ආර්ථික ප්‍රතිපත්තීන් මත බොහෝ දුරට වෙනස් වී ඇති බවත්ය. විශේෂයෙන් මෙහි දී සාම්ප්‍රදායික ඉඩම් භුක්ති රටාවන් (අත්තම, කයිය, තට්ටුමාරු, කරමාරු) මේ වනවිට වෙනස් වී තිබේ. මීට අමතරව සාම්ප්‍රදායික අවධියේ කුලය සහ සම්බන්ධ වූ දැඩි බැඳීම් ලිහිලි වී පහත් යැයි සම්මත කුල වලටද සමාජය තුල චලනය වීමට වැඩි ඉඩ ප්‍රස්ථාවක් උදා වී ඇති බවද හඳුනා ගත හැකි විය.